PN/Tax Returns/2020-01
21.04.2020

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## බදු ගෙවන්නන් වෙත කෙරෙන නිවේදනයයි

**උපයන විට ගෙවීමේ බදු, රඳවා ගැනීමේ බදු, ආර්ථික සේවා ගාස්තු, මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු අතුරු ඇස්තමේන්තුව සහ පැවරුම් මිල අනාවරණ ආකෘතිය භාර දිය යුතු දිනයන් දීර්ඝ කිරීම**

දැනට රට තුළ පවතින තත්වය සලකා බැලීමෙන් පසු, පහත සඳහන් බදු වාර්තා භාර දිය යුතු දිනයන් 2020 මැයි මස 31 වන දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

- සේවා යෝජකගේ වාර්ෂික ප්‍රකාශය (උපයන විට ගෙවීමේ බදු වාර්තාව) - තක්සේරු වර්ෂ 2019/2020
- රඳවා ගැනීමේ බදු ප්‍රකාශය - තක්සේරු වර්ෂ 2019/2020
- ආර්ථික සේවා ගාස්තු වාර්තාව - තක්සේරු වර්ෂ 2019/2020
- 2020 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාර්තුව සඳහා සමථයකට පත් කළ යුතු මුද්දර ගාස්තු වාර්තාව
- 2019/2020 තක්සේරු වර්ෂයේ අවසන් මාස හය සඳහා මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු අතුරු ඇස්තමේන්තුව (තක්සේරු වර්ෂ පදනම මත වාර්තා භාර දෙනු ලබන මූල්‍ය ආයතන සඳහා)
- පෙබරවාරි, මාර්තු මාස සහ 2020 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන කාර්තුව සඳහා වන එකතු කළ අගය මත බදු වාර්තාව
- 2018/2019 තක්සේරු වර්ෂය සඳහා පැවරුම් මිල අනාවරණ ආකෘතිය

කෙසේ වෙතත්, ඉහත කාලසීමා සඳහා එකතු කළ අගය මත බදු, ආර්ථික සේවා ගාස්තු සහ උපයන විට ගෙවීමේ බදු වාර්තා සහ රඳවා ගැනීමේ බදු උපලේඛන දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ඊ-සේවාව හරහා ඉදිරිපත් කිරීම සඳහා බදුගෙවන්නන් වෙත පහසුකම් සලසා ඇත.

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

බදු - වඩා හොඳ අනාගතයකට